ඇගයීම අංක 01

01. **"හීනවන ඵල නීතිය"** වඩා නිවැරදිව විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවර ප්‍රකාශ මගින් ද?

I. කිසියම් භාණ්ඩයක් පාරිභෝගික කරන විට මුළු තෘප්තිය අඩුවන වේගයෙන් ඉහළ යයි.

II. ස්ථාවර සාධකයක් සමඟ විචල්‍ය සාධකයින් වැඩි වැඩියෙන් යෙදවීමේදී මුළු නිෂ්පාදිතය අඩුවන වේගයකින් ඉහළ නගී.

III. සියලුම සාධක සමානුපාතිකව වැඩි කරනු ලබන විට මුළු නිෂ්පාදිතය අඩුවන වේගයෙන් ඉහළ නගී.

IV. ස්ථාවර සාධකයක් සමඟ විචල්‍ය සාධකයක් වැඩි වැඩියෙන් යෙදවීමේ දී, නිෂ්පාදනයේ ආන්තික පිරිවැය අඩු වේ.

V. සියලුම සාධක සමානුපාතිකව වැඩි කරනු ලබන විට, නිෂ්පාදනයේ ආන්තික පිරිවැය ඉහල නගී.

02. නිෂ්පාදන ක්‍රියාවලියක **"කෙටි කාලය"** වශයෙන් හඳුන්වන කාලපරිච්ඡේදයක දී,

I. සමහර යෙදවුම් ප්‍රමාණ නොවෙනස්ව පවතින අතර සමහර යෙදවුම් ප්‍රමාණ වෙනස් කළ හැකිය.

II. බොහෝ යෙදවුම්වල හිඟයක් ඇත.

III. වැඩිපුර කම්කරුවන් සේවයට යොදවා ගැනීමට ආයතනයට නොහැකි වේ.

IV. නිෂ්පාදනය කරනු ලබන නිමැවුම් ප්‍රමාණය නොවෙනස්ව පවතී.

V. සියලුම යෙදවුම් ස්ථාවරව පැවතියත් නිමවුම වෙනස් කළ හැකිය.

03. **"නිෂ්පාදන ශ්‍රිතය"** සම්බන්ධයෙන් එකඟ විය නොහැකි ප්‍රකාශය තෝරන්න.

I. යෙදවුම් ප්‍රමාණයට ලබා ගතහැකි සාමාන්‍ය නිමවුම් ප්‍රමාණය පෙන්වයි.

II. යෙදවුම් හා නිමවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාව පෙන්වයි.

III. කෙටිකාලයේදී ශ්‍රිතයේ ඇතුළත් විචල්‍ය යෙදවුම් වැඩි කිරීමෙන් නිෂ්පාදනය වැඩිකිරීමෙන් නිෂ්පාදනය වැඩි කළ හාකිය.

IV. කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය තුළ ස්ථාවර හා විචල්‍ය යෙදවුම් වර්ග දෙකක් ඇතුළත් වේ.

V. තාක්ෂණය හා ආයතනයේ ධාරිතාව නොවෙනස්ව පවතී නම් යෙදවුම් හා නිමවුම් අතර අනුලෝම සම්පන්ධතාවක් පෙන්වයී.

04. සියලුම යෙදවුම් වෙනස් කරමින් නිෂ්පාදනයේ නිරත වන ආයතනයක නිමවුම හැසිරෙන ආකාරය නිරූපණය වන්නේ,

I. හීනවන ආන්තික ඵලදා නීතිය මඟිනි.

II. හීනවන පරිමාණානුකූල ඵල නීතිය මඟිනි.

III. පරිමාණානුකූල ඵල නීතිය මඟිනි.

IV. පරිමාණානුකූල නොපිරිමැසුම් මඟිනි.

V. වැඩෙන පරිමාණානුකූල ඵල මඟිනි.

LIVEWORKSHEETS

05. සුදුසු පිළිතුර තෝරන්න.

| කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය | දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය |
| --- | --- |
| | |
| | |
| | |

ස්ථාවර හා විචල්‍ය යෙදවුම් වර්ග දෙකම දැක ගත හැකිය

පරිමාණානුකූප ඵල නීතිය ක්‍රියාත්මක වේ.

සියලුම සාධක විචල්‍ය සාධක වේ.

මූලික තාක්ෂණය නොවෙනස්ව පවතී

හීනවන ආන්තික ඵලදා නීතිය ක්‍රියාත්මක වේ

නිෂ්පාදන ආයතනයේ පරිමාව වෙනස් කළ හැකිය.

LIVEWORKSHEETS